**ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 100.62 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 91.78 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 8.84 ක් හෙවත් සියයට 8.79 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 78.68 | 78.63 | 0.05 | 0.06 |
| මූලධන | 21.94 | 13.15 | 8.79 | 40.06 |
| **එකතුව** | **100.62** | **91.78** | **8.84** | **8.79** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.81 | 3.07 | 2.71 | 3.46 | 18.00 | 13.07 |

**2.3 විගණන නිරීක්ෂණය**

ව්‍යාපෘති කළමනාකරණය හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විදේශාධාර ව්‍යාපෘති**

2013 ජූලි මාසයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා වූ කාලය තුළදී දෙපාර්තමේන්තුව විසින් විදේශ මූල්‍යාණය යටතේ උපායමාර්ගික ස්ථානීකරණ ව්‍යාපෘතිය (SPoDPMM) ක්‍රියාත්මක කර තිබුණි. ගිවිසුම අනුව එහි සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය එකතුව එ.ජ.ඩො. 160,164 ක් වී තිබුණු අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එ.ජ.ඩො. 72,422 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ හා ඇගයීමේ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය (INDIS) නවීකරණය කිරීම හා ශක්තිමත් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් එ.ජ.ඩො. 94,500 ක ප්‍රදානයක් 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. ව්‍යාපෘති කාලය අවසන් වන 2015 දෙසැම්බර් 31 දිනට ඉන් එ.ජ.ඩො. 23,178 ක් හෙවත් සියයට 24.5 ක් පමණක් උපයෝජනය කර තිබුණි. පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සේවය ලබාගෙන තිබුණද, වර්ෂය අවසන් වන විටත් එම පද්ධතියේ නවීකරණ කටයුතු නිම කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ව්‍යාපෘති ඇගැයිම් හා අධීක්ෂණය කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති මුදලින් නිලධාරීන් 12 දෙනෙකුට දේශීය පුහුණුවීම් සඳහා රු.975,475 ක් 2014 වර්ෂයේදී වැය කර තිබුණි. ඉන් නිලධාරීන් 8 දෙනෙකු දේශීය පුහුණුකිරීම් වෙනුවෙන් රු.788,975 ක් වියදම් කර තිබුණත්, 2016 වර්ෂයේදී එම නිලධාරින් ස්ථාන මාරුවීම් ලබා තිබුණි.

ඉදිරියේදී දෙපාර්තමේන්තුව විසින් යම් නිලධාරියෙකුට ප්‍රමාණවත් පිරිවැයක් දරා පුහුණුවීම් කරනු ලැබුවහොත් පුහුණුවෙන් පසුව නිලධාරීන් විසින් දෙපාර්තමේන්තුවට අවම වශයෙන් සේවය කළ යුතු වසර ගණන තීරණය කර ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබා ගෙන එම නිලධාරීන් සමඟ ගිවිසුමකට ඇතුල්වීමට කටයුතු කිරීමට සටහන් කර ගත් බව අධ්‍යක්ෂ ජනරාල්වරිය විගණනය වෙත දන්වා තිබුණි.

### 3.2 කාර්යසාධනය

---------------

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණය පහත දැක්වේ.

ක්ෂේත්‍ර චාරිකා මඟින් ව්‍යාපෘති අධීක්ෂණය කිරීමට සැලැසුම් කර තිබුණද, 2015 වර්ෂයේදී ක්‍රියාත්මක වූ දේශීය හා විදේශීය ව්‍යාපෘති 1051 කින් ව්‍යාපෘති 13 කට අදාළව පමණක් ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කර තිබුණි. එම ව්‍යාපෘති දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි තෝරා ගෙන නොතිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 4 ක පමණක් ව්‍යාපෘති විමර්ශන චාරිකා සිදු කර තිබුණි.

වර්ෂය තුළ ක්‍රියාත්මක වන සියළුම ව්‍යාපෘති සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදු නොකරන අතර ප්‍රගති සමාලෝචනවලදී ගැටළු වාර්තා වී ඇති, එමෙන්ම අපේක්ෂිත ඉලක්කගත ප්‍රගතිය ළඟා කර ගෙන නොමැති ව්‍යාපෘති සඳහා පමණක් ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදු කරනු ලබන බව අධ්‍යක්ෂ ජනරාල්වරිය විගණනය වෙත දන්වා තිබුණි.

### 3.3 අනාර්ථික ගනුදෙනු

--------------------

එකතුව 93 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයකින් සමන්විත මෙම දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රී ලංකා මහ බැංකු ගොඩනැගිල්ලේ වර්ග අඩි 10,707.4 ක වපසරියක් සහිත මහල් 02 ක් භාවිතා කරනු ලබන අතර ඒ වෙනුවෙන් වර්ග අඩියකට රු. 200 බැගින් 2015 වර්ෂයේ කුලී වශයෙන් රු. 25,697,760 ක් ගෙවා තිබුණි. එය 2015 වර්ෂයේ පුනරාවර්තන වැය සඳහා ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 78,680,185 ක ප්‍රමාණයෙන් සියයට 33 ක් නියෝජනය කරනු ලබන බව නිරීක්ෂණය විය.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 37 | 29 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 35 | 23 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 18 | 02 |
| | **එකතුව** | **93** | **71** | **22** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව විසින් පත්වීම් බලධාරියාගේ අනුමැතියකින් තොරව අවිධිමත් ලෙස සංවර්ධන නිලධාරියෙකු වෙනත් පාර්ශවයක් වෙත මුදා හැර තිබුණු අතර එම නිලධාරියා සඳහා 2014 ඔක්තෝබර් 15 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා රු. 576,774 ක වැටුප් හා දීමනා දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.